තානාපතිනි ඇලයිනා බී. ටෙප්ලිට්ස්,

ඇමරිකන් වාණිජ මණ්ඩල රැස්වීමේදී දැක්වූ අදහස්

නොවැම්බර් 29, 2018

මා සම්බන්ධයෙන් කළ කාරුණික හැඳින්වීම ගැන ඔබට ස්තුතියි. මෙහි පැමිණීමට ලැබීම ගැන මම ඉතා සතුටු වෙමි. මා මෙහි පැමිණෙන අතර ඔබ කීප දෙනෙකුට පැවසූ ආකාරයට කොළඹ මා ගත කළ මුල් සති හතරේ මගේ කාලය වෙන් වූයේ ඔබ දිනපතා පුවත්පත්වල කියවන කාරණා සම්බන්ධයෙන් වන අතර මගේ සිතේ ඒ පිළිබඳ අදහස් කීපයක් තිබේ. නමුත් නිවාඩු සමය එළඹෙන මේ කාලය අතීතය මෙනෙහි කිරීමට සුදුසු අවස්ථාවක් වන අතර මා සිතන ආකාරයට වාණිජ මණ්ඩලය ලබා ඇති ජයග්‍රහණ ඉතා වැදගත් වේ. මෙය ඉතා ක්‍රියාකාරී කණ්ඩායමක් ලෙස පෙනෙන අතර ශ්‍රී ලංකාව තුළ ඇමරිකානු ආයෝජන හා ව්‍යාපාරික සබඳතා වැඩි දියුණු කිරීමට අපට කළ හැකි කුමක් දැයි සොයා බැලීමට මෙහි විධායක කණ්ඩායමේ සාමාජිකයන් සමග කටයුතු කිරීමට මම බලාපොරොත්තු වෙමි.

මෙය ඉදිරියට යෑම හා අනාගතය ගැන මෙන් ම එයින් ලබා ගත හැක්කේ කුමක් ද යන්න ගැන සිතීමට සුදුසු කාලයයි. මගේ කණ්ඩායම මෙම සබඳතාව ඊළඟ මට්ටමට ගෙන යෑමට දැඩි උනන්දුවක් දක්වන නමුත් මෙම පරිසරයේ වෙනසක් කළ හැකි ඉතා වැදගත් ප්‍රතිපත්ති හා නියාමන වෙනසක් වෙනුවෙන් ද පෙනී සිටී.

අපේ ආයෝජන සබඳතා දිගටම වර්ධනය වන අතර පසුගිය අවුරුදු දහය ඇතුළත අපේ දෙ-මං වෙළඳාම සියයට 40කින් වැඩි වී ඇති බව පෙනේ. 2007 දී ඩොලර් බිලියන 2.3ක් වූ මෙම වෙළඳාම 2017 වන විට ඩොලර් බිලියන 3.2ක් වී තිබේ. 2018 ඉතා වැදගත් හා අභියෝගාත්මක වර්ෂයක් වුවත් රටවල් දෙකට ම මෙය ඉතා ප්‍රබල වනු ඇතැයි අනාවැකි පළ වී ඇති අතර එය එසේම වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ශ්‍රී ලංකාවේ විශාල ම අපනයන වෙළඳපොළ එක්සත් ජනපදය වන අතර මේ රටේ විශාල ම විදේශීය ආයෝජකයන් වන්නේ ද ඇමරිකන් සමාගම් ය. අපි රැකියා දහස් ගණනක්, කුසලතා, නව තාක්ෂණය මෙන් ම මෙහි ව්‍යාපාරික පරිසරයට ඉහළ ම මට්ටමේ ආචාරධර්මී හා වැඩපොළ ප්‍රමිති ද ගෙන එන්නෙමු. මේවා ඔබ සියල්ලන්ට ම ආඩම්බර විය හැකි ජයග්‍රහණයන් වන අතර මම ද ඒ සම්බන්ධයෙන් ආඩම්බර වෙමි.

එක්සත් ජනපදය හා ශ්‍රී ලංකාව අතර ඇති සබඳතාවේ ගුණාත්මකබව මෙයින් ඉතා හොඳින් පැහැදිලි වේ.

දේශපාලන වාතාවරණය දෙස බලන විට මට සිතෙන්නේ  මෙම සබඳතාව අවදානම් තත්වයකට පත් වී ඇති බවයි. මම මේ ගැන කනස්සල්ලට පත් වන්නේ සියල්ල හොඳින් සිදු වී ගෙන යන මෙන් ම එම ප්‍රවණතාව දිගටම පවත්වා ගත යුතු අවස්ථාවක මෙවැනි දෙයක් සිදුවීම ගැනයි. මා මෙහි පැමිණීමෙන් පසු මගේ අවධානය යොමු වූ ප්‍රධාන කරුණක් වූයේ දේශපාලන අර්බුදය වන අතර මෙම අර්බුදය ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික  ආයතනවලට තර්ජනයක් පමණක් නොව එය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට හා පසුගිය අවුරුදු කීපය තුළ ලබාගත් සමහර ජයග්‍රහණයන්ට ද තර්ජනයකි.

සමහර ආර්ථික දර්ශක දැනටමත් පහළට යන ප්‍රවණතාවක් පෙන්නුම් කරන අතර ඔක්තෝබර් මාසයේ සංඛ්‍යා දෙස බලන විට මට සිතෙන්නේ මෙම අර්බුදය මගින් නරක ප්‍රවණතාව වේගවත් කර ඇති බවයි. තත්වය තවත් නරක අතට හැරුණා පමණක් නොව මට සිතෙන්නේ අනිත් අය, විශේෂයෙන්ම දේශපාලන ක්ෂේත්‍රයේ සිටින අපේ සගයන් නො සිතන ආකාරයට එහි පල විපාක අනිත් අවුරුද්ද දක්වා විහිදෙනු ඇති බවයි.

ආර්ථික වර්ධන ප්‍රක්ෂේපණ පහත දමා තිබේ. මහ බැංකුවේ මැදිහත් වීම මැද පවා ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වෙමින් පවතී. සංචාරක කර්මාන්තයේ කාමර වෙන් කරවා ගැනීම් සියයට 12 සිට 30 දක්වා ප්‍රමාණයක් අවලංගු වී ඇති බව වාර්තා වී තිබේ. එක්සත් ජනපදය ඇතුළු සංවර්ධන හවුල්කරුවන් ඔවුන්ගේ ව්‍යාපෘති නතර කර තිබේ. 2019 දී ගෙවීමට ඇති ඩොලර් බිලියන 5.6ක ණය සඳහා අරමුදල් සපයා ගැනීම ශ්‍රී ලංකාවට අභියෝගයක් වනු ඇත. මූඩිගේ (Moody’s) රාජ්‍ය ණය ඇගයුම පහත දැමීම ආයෝජක විශ්වාසය මත දැඩි බලපෑමක් කළ අතර මා සිතන ආකාරයට මෙය ආපසු හැරවිය හැකි ප්‍රවණතාවක් වුවත් ඒ සඳහා බොහෝ වැඩ කටයුතු කිරීමට සිදු වේ.  දේශපාලන අර්බුදය ඉක්මනින් විසඳා ගැනීමට නොහැකි වුවහොත් මෙම කටයුතු වඩාත් අභියෝගාත්මක වනු ඇත.

මේ සම්බන්ධයෙන් අපි කළ යුත්තේ කුමක් ද?  ඔබ බොහෝ දෙනෙක් ඔබේ සබඳතා ප්‍රයෝජනයට ගනිමින් මෙම අර්බුදය, ව්‍යාපාරවලට  හිතකර නොවන බව දැක්වෙන

පණිවුඩය යවා ඇති බව මම දනිමි. මෙය ශ්‍රී ලංකාවේ ව්‍යාපාරවලට හිතකර නොවන අතර එය ශ්‍රී ලංකාවේ බොහෝ හවුල්කරුවන් හා මිතුරන්ට ද හිතකර නොවේ. මම ශ්‍රී ලංකාවේ මිතුරෙක් ද මම නියෝජනය කරන රට ශ්‍රී ලංකාවේ නියම මිතුරෙක් ද වන බැවින් මේ අර්බුදය විසඳීමට ඉක්මන් දේශපාලන විසඳුමකට එළඹෙන ලෙස සියලු පාර්ශවවල දේශපාලනඥයින්ගෙන් ඉල්ලා සිටිමු. වඩා වැදගත් වන්නේ එය ලොව පුරා පිළිගැනීමට ලක් වන නීත්‍යානුකූල රජයක් ස්ථාපිත කෙරෙන විනිවිදභාවයෙන් යුත් ප්‍රජාතාන්ත්‍රික දේශපාලන විසඳුමක් වීමයි.

අපි මෙම අර්බුදය විසඳා ගැනීමට ආධාර කරන්නේ ආර්ථික, ආරක්ෂක, සංවර්ධන ක්ෂේත්‍රවල මෙන් ම ජනතාවන් අතර ඇති පුළුල් සබඳතා නිසා ය. නමුත් මූලික වශයෙන් අපි විසඳුමකට ආධාර කරන්නේ රටට මෙන් ම අපේ හවුල්කරුවන් වන ජනතාවටත් සිදු වන හානිය සැලකිල්ලට ගනිමිනි. නිසැක ව දිගටම පවතින අවිනිශ්චිත බව ව්‍යාපාරවලට හානිකර වන අතර එය ශ්‍රී ලංකාවේ ජනතාවට ද අහිතකර වේ. අපේ මිතුරෙකුට හා හවුල්කරුවෙකුට අපි එවැන්නක් ප්‍රාර්ථනා නො කරමු.

මෙම දේශපාලන අර්බුදයට ඉක්මන් හා පාරදෘශ්‍ය විසඳුමක් අපේක්ෂාව කරන අතර අප රටවල් අතර ඇත්තේ ඉතාම සුහද මිත්‍රත්වයක් යයි මම විශ්වාස කරමි. එය නිර්ව්‍යාජත්වය හා අවංකත්වය විදහා පාන සබඳතාවකි. අපේ උපදෙස් හා අදහස්, මැදිහත් වීමක් නොවේ. මෙය පසුගිය සති කීපය තුළ මා පුවත්පත්වල බොහෝ කියවා ඇති දෙයකි. ඇඟිලි ගැසීම යනු ඡන්දදායකයන් ධ්‍රැවීකරණය කරන ව්‍යාජ මුහුණු පොත් කණ්ඩායම් හා මූලාරම්භය නො දන්නා රාත්‍රියේ නිකුත් කරන බොට් ආදියයි. එසේ නැත්නම් වසා ගත් කාමර තුළ සිදු වන මුදල් ගනුදෙනුයි. එක්සත් ජනපදය හා ශ්‍රී ලංකාව අතර ඇති පාරදෘශ්‍ය සබඳතාව එවැන්නක් නොවේ. අපේ ව්‍යාපාරික ප්‍රජාවෙන් නිරූපණය වන්නේ ද එවැනි ආකාරයේ සබඳතාවක් නොවේ. ඒ වෙනුවට අපේ සබඳතාවේ ගුණාත්මක බව විදහා දක්වන්නේ අපේ පාරදෘශ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශන හා අපේ යහපත් හවුල්කරුවෙක් වන ශ්‍රී ලංකාව කෙරෙහි අපේ අපේක්ෂාවන් හා ප්‍රාර්ථනාවන් ය. අපි සැලකිලිමත් වන කරුණු සම්බන්ධයෙන් අපි විවෘත වෙමු. අපි පුද්ගලිකව ප්‍රකාශ කරන දෙය ම ප්‍රසිද්ධියේ ද ප්‍රකාශ කරමු.

මම සිතන්නේ එය, අප මෙම රටට දක්වන ඉමහත් ගෞරවයේ කොටසක් බවයි. මෙම කලාපය සම්බන්ධයෙන් අප පුළුල් වශයෙන් සැලකිලිමත් වන කරුණු ඇති අතර ඒ සම්බන්ධ අපේක්ෂාවන් හා අභිලාෂයන් ද තිබේ. අපි දැකීමට කැමති වන්නේ නිදහස් හා විවෘත ඉන්දු-පැසිෆික් කලාපයක් වන අතර මෑත දී ජනාධිපති ට්‍රම්ප් ප්‍රකාශ කර ඇත්තේ මේ කලාපය පුරාම හවුල් කරුවන් සිටීම ඇමරිකාවට හිතකර බවයි. ඔවුන් කිසිවෙක් මත යැපෙන්නේ නැති, ශක්තිමත් හා සමෘද්ධිමත් හවුල් කරුවන් විය යුතුය. මෙය මූලික වශයෙන් අපේ සබඳතාවල ඇති අන්‍යෝන්‍ය ගෞරවයයි. මිතුරෙක් මෙන් ම ගෝලීය වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් වෙනුවෙන් සටන් කරන්නෙක් ලෙස ශ්‍රී ලංකාවේ මෙම හානිකර දේශපාලන අර්බුදය, අපේ ද්වි-පාර්ශවික සබඳතාවන්ට බලපාන ආකාරය මෙන්ම ශ්‍රී ලංකාවට එය බලපාන ආකාරය පිළිබඳ අපේ ඇගයීම ඉදිරිපත් කිරීම අපේ වගකීමක් වෙයි.

කෙසේ වෙතත් මෙම තත්වය විසඳා ගන්නේ කෙසේ ද යන්න ගැන අපට දැනුමක් ඇතැයි අපි විශ්වාස නො කරමු. එය ශ්‍රී ලංකාවේ ජනතාවට හා දේශපාලනඥයන්ට අයිති කාර්යයක් යයි මම සිතමි. රටේ යහපතටත්, පුරවැසියන්ගේ යහපතටත් හේතු වන ආකාරයට පාරදෘශ්‍ය ලෙස හා ප්‍රජාතන්ත්‍රවාදී ලෙස එය විසඳා ගනු ඇතැයි යන්න අපේ අපේක්ෂාවයි.

මෙහොතකට වර්තමානයෙන් ඉවතට යමින් ඉදිරිය දෙස බලමින්, මම අද උදෑසන මගේ කාර්ය මණ්ඩලයට ප්‍රකාශ කළ පරිදි, මෙම දොම්නස් සහගත මාතෘකාවෙන් ඔබ්බට යමින් අපට කළ හැකි කුමක් ද යන්න ගැන හා අනාගතය පිළිබඳ අපේ අපේක්ෂා හා අභිලාෂයන් ගැන කථා කරමු.

මෙම අපේක්ෂා හා අභිලාෂ මොනවා ද? අප යා යුත්තේ කොහාට ද? මම ආරම්භයේ දී සඳහන් කළ පරිදි අපේ වෙළඳ හා ආයෝජන සබඳතාවල වර්ධනයක් දැකීමට අපි කැමැත්තෙමු. ශ්‍රී ලංකාවට තිරසාර හා සාධාරණීය ආර්ථික වර්ධනයක් ළඟා කර ගත හැකි බවත්, සදාචාර සම්පන්න ආයෝජන හා අන්‍යෝන්‍ය වෙළදාම තුළින් අපට එක් ව එය කළ හැකි බවත් මම විශ්වාස කරමි. ඉන්දු පැසිෆික් කලාපයේ ශ්‍රී ලංකාව තීරණාත්මක ස්ථානයක් වන අතර මේ කලාපයේ අපේ වාර්ෂික වෙළදාම ඩොලර් ට්‍රිලියන 1.8කට වඩා වැඩි වේ. ඉන්දු පැසිෆික් කලාපයේ අපේ මුළු ආයෝජනය ද

ඩොලර් ට්‍රිලියනයක් පමණ වේ. එය චීනය, ජපානය හා දකුණු කොරියාවේ ආයෝජනවල එකතුවට වඩා වැඩි ප්‍රමාණයකි.

මෙහි බොහෝ ආයෝජන අවස්ථාවන් ඇති අතර එක්සත් ජනපදයට එම වර්ධනයේ කොටස්කරුවෙකු විය හැකි බව මම දනිමි.

මෑත දී පළ වූ මත කතුවැකියක අපේ උප ජනාධිපති පෙන්ස්, 'බිල්ඩ්' (BUILD) පනතේ අදාළ කොටස ඉස්මතු කළේ ය. මෙය ලොව පුරා ඇති රටවල් සමග වැඩ කිරීමටත්, ඒවායේ ආයෝජනය කිරීමටත් එක්සත් ජනපදයේ හැකියාව ශක්තිමත් කරන නව නීතියකි. මේ මගින් එක්සත් ජනපදයේ සංවර්ධන මූල්‍ය ධාරිතාව ඩොලර් බිලියන 60ක් දක්වා වැඩි කෙරේ. මේ මගින් ලෝක මට්ටමේ වරාය හා ගුවන් තොටුපළවල්, මහා මාර්ග, දුම්රිය මාර්ග, නල මාර්ග, දත්ත මාර්ග හා එම රටවලට මෙන් ම එක්සත් ජනපදයටත් නියත ප්‍රතිලාභ අත් වන වෙනත් ව්‍යාපෘති සඳහා ආධාර කිරීමට එක්සත් ජනපදයට හැකි වනු ඇත. අපි ශ්‍රී ලංකාවත් සමග විවිධ දේ ඉදිකිරීමට සූදානම් අතර ඔබ ද එසේ කිරීමට සූදානම් බව මම දනිමි.

සංවර්ධනය හා වර්ධනය මෙහෙයවීමට පුද්ගලික අංශය ආධාර කරන දැක්මක් පිළිබඳ ව අපි විශ්වාස කරමු. මගේ රාජකාරිය එය වන බැවින්, රජයේ කාර්යභාරය ගැන මම අවධාරණය කරන නමුත් නියම ආර්ථික වර්ධනය හා සබඳතා ඇති වන්නේ ඔබේ කටයුතුවලින් බව මම දනිමි. ඔබේ නිරතවීම්, ජාතික මායිම් හරහා ඔබ ගොඩ නගන සබඳතා හා බැඳීම් මෙයට මූලික වන අතර අපි ඒ ගැන විශ්වාසය තබමු.

මේ නිසා ඊළඟ මාසවල දී මෙහි ව්‍යාපාරික තත්වය, ප්‍රජාව හා මෙම ආර්ථික අභිලාෂයන් ළඟා කර ගන්නා ආකාරය පිළිබඳ ව ඔබෙන් දැන ගැනීමට මම බලාපොරොත්තු වෙමි. වඩා වැදගත් වන්නේ වෙළඳාම හා ආයෝජනයට ඇති බාධක ඉවත් කරන්නේ කෙසේ ද යන්න යි.

ඇමරිකන් වාණිජ මණ්ඩලය විසින් වෙළඳාම හා ආයෝජනය පිළිබඳ වාර්තාවක් පිළියෙල කිරීමට යන බව මට මෑත දී දැන ගැනීමට ලැබුණු අතර එය කියවීමට මම ඉතා ආසාවෙන් සිටින බව ප්‍රකාශ කරමි. එපමණක් නොව ඒ මත පිහිටා අවශ්‍ය

පියවර ගැනීමටත්, දැනට ඇති බාධක ඉවත් කර ගැනීමටත්, මෙහි සාධාරණ හා ලෙන්ගතු ආයෝජන වතාවරණයක් ඇති බව සහතික කිරීමටත් කටයුතු කරමි.

තානාපති කාර්යාලය, සංවර්ධන හා තාක්ෂණික වැඩසටහන් තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දිගටම ආධාර කරනු ඇත. අපේ රටවල් දෙකට ම දීර්ඝ කාලීන ප්‍රතිලාභ ලැබෙන ආකාරයට අපේ හවුල් සබඳතාව පවත්වා ගැනීමට අප කැප වෙන අතර මෙහි දී වැදගත් වන්නේ අප සියලු දෙනාට ම ලබා ගත හැකි අන්‍යෝන්‍ය ප්‍රතිලාභයි.

මෙම උත්සවයේ ඔබ ඇමතීමට මට ආරාධනය කිරීම ගැන ඇමරිකන් වාණිජ මණ්ඩලයටත්, එහි සභාපති හා විධායක මණ්ඩලයටත් ස්තුති කිරීමට කැමැත්තෙමි. ඔබේ ජාලකරණ ඉසව්වෙන් කෙටි කාලයක් මට සවන් දීමට යෙදවීම ගැන ඔබ සියලු දෙනාට ම ස්තුතියි.

ඔබ සියලු දෙනාට ම ප්‍රීතිමත් නිවාඩු සමයක් ප්‍රාර්ථනා කරන අතර ඉදිරි මාස හා අවුරුදුවල දී ඔබ සමග එක් ව කටයුතු කිරීමට මම බලාපොරොත්තු වෙමි.

ඔබ සියලු දෙනාට ම ස්තුතියි.